මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கட்டுகஸ்தோட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: cpcpsc@yahoo.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213096<br>081-2213097 |

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/10/SUP/MERIT - 2025
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2025.09. 19

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ආයතන ප්‍රධානීන් වෙත,

**කුසලතා පදනම මත මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ**
**අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරඟ විභාගය - 2025**

රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2025.07.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2025 මඟින් ඉහත විභාගය සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, එකී නිවේදනය මධ්‍යම පළාතට අදාළ කර ගැනීම සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක ජීසීපී/01/1/1 හා 2025.07.25 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. එමෙන්ම, උක්ත විභාග නිවේදනය ප්‍රසිද්ධ කිරීම සඳහා විභාග කොමසාරිස් ජනරාල්ගේ අංක 5/4/1/08/2025 (24) හා 2025.09.19 දිනැති ලිපියෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ එකඟතාවයද ලැබී ඇත.

02. ඒ අනුව, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට අදාළ අභ්‍යන්තර නිවේදනය www.psc.cp.gov.lk වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇති අතර, එම චක්‍රලේඛය හා මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.04.07 දිනැතිව අනුමත කරන ලද 2013.04.02 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලටද යටත්ව, ඔබ ආයතනයේ සේවය කරනු ලබන මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සුදුසුකම් ලත් නිලධාරීන් වෙතොත් ආදර්ශ අයදුම්පතට අනුව සකස් කරන ලද අයදුම්පත් **2025.10.21** දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් මෙම කොමිෂන් සභාව වෙත එවන ලෙස කාරුණිකව දන්වමි.

03. විභාග ගාස්තුව රු. 600/-කි. මෙම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ මධ්‍යම පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙසය. මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවන ලෙස අයදුම්කරුවන් දැනුවත් කරන්නේ නම් මැනවි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත් -
01. දිස්ත්‍රික් ලේකම් (මහනුවර/මාතලේ/නුවරඑළිය) - දැ.ගැ.පි
02. මධ්‍යම පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත - ඉහත සඳහන් විභාගයට අදාළ විභාග ගාස්තු 2025.10.21 දින දක්වා භාර ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැන්වීම පිණිස